පාරිභෝගික අධ්‍යාපනික වැඩ සටහන් සහ පාරිභෝගික සංවිධාන සංවර්ධනයට මුදල් ලබාදීම සඳහා පාරිභෝගික ආරක්ෂණ අරමුදලක් පිහිටුවන ලදී. වර්ෂය අවසානය වන විට අරමුදල වෙනුවෙන් බැරවී තිබූ ප්‍රමාණය රුපියල් 1,15,000 වූයේය. නිදහස් තරඟකාරී වෙළෙඳපළක ප්‍රයෝජනවත් භාවය පාරිභෝගිකයාට අවබෝධ කරනු සඳහා අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව විසින් 1980 දී මහ පොළ වෙළඳ ප්‍රර්ශන සහ අනිකුත් ප්‍රදර්ශන වලදී පාරිභෝගික අධ්‍යාපන කවුළු පවත්වා ගෙන යන ලදී. පාරිභෝගික සමිති පිහිටුවීම පටන් ගත් අතර වර්ෂය අවසාන වන විට එවැනි සමිති 905 ක් පිහිටුවන ලදී.

## සංචාරක ව්‍යාපාරය

පසුගිය දශකය තුල දී සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම, සේවා නියුක්තිය, ආදයම් උත්පාදනය සහ ප්‍රාදේශීය සංවර්ධනයට අදළ වූ වැදගත් සාධකයක් ලෙස ඉස්මතු වූ බව දක්නට ඇත.

1980 දී ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාව 3,21,780 ක් වූ අතර මෙය එම වර්ෂය සඳහා ඉලක්කය වූ 2,98,000 සියයට 8 කින් ඉක්මවීමකි; තව ද, එය පසුගිය අවුරුද්දේ පැවති මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාවට වඩා සියයට 29 ක වැඩි වීමකි. එමෙන්ම, මෙම අවුරුද්දේ වූ පැමිණීම් සංඛ්‍යාවේ වර්ධනය පසුගිය දශකයේ පැවති සාමාන්‍ය වර්ධන වේගය වූ සියයට 22·5 ටද වඩා ඉහළ මට්ටමක් පිළිබිඹු කළේය. එසේ වුවද, 1980 දී වාර්තා වූ සංචාරකයින් පැමිණීමේ වර්ධන වේගය 1979 වර්ෂයේ වාර්තා වූ වර්ධන වේගයට වඩා අඩු බව පෙන්වා දිය යුතුය. සංක්‍රාමික මගීන් හැර, නැවගත මගීන් සහ පැය 24 ට වඩා අඩු තාවකාලික කාලයක් රට තුළ රැඳෙන, සංචාරකයන් 8,636 ක්ද 1980 දී මෙරටට පැමිණියහ. මෙය, මෙබඳු පැමිණීම්වල මෑතකදී දක්නට ලැබුණ අඩුවීමේ ප්‍රවනතාවයට ප්‍රතිවිරුද්ධ ලක්ෂණයකි.

කෙසේ වුවද, සංචාරකයින් රට තුළට පැමිණීමේ සංඛ්‍යාව, රටක සංචාරක ව්‍යාපාරයේ ව්‍යාප්තිය දක්වෙන පූර්ණ දර්ශකයක් සේ ගත නොහැකිය. මන්දයත්, සංචාරකයින් රට තුළ ගත කරන දින ගණන සංචාරකයින්ගේ ප්‍රමාණය මැනීමේ වඩා සාර්ථක මිනුම් දණ්ඩක් බැවිනි. 1980 වර්ෂයේ සංචාරකයින් මෙරට ගත කළ දින ගණන සියයට 27 ක වාර්ෂික වර්ධන වේගයක් දක්වමින් දශ ලක්ෂ 3·5 ක් බවට පත්විය. එහෙත්, සංචාරකයන් රට තුළ ගත කළ දින ගණන වැඩිවීමේ වේගය, සංචාරකයින් මෙරටට පැමිණීම වැඩි වීමේ වේගයට වඩා අඩු වූ බව පෙනේ. සංචාරකයකු රට තුළගත කරන සාමාන්‍ය දින ගණන 1975 දී 9·8 සිට 1979 දී දින 11·1 දක්වා වැඩි වුවත්, 1980 දී ඉතා සුළු වශයෙන් අඩු වීමක් පෙන්නුම් කරමින් එය දින 11 ක් විය.

1980 මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 67 ක්ම, මෙතෙක් ප්‍රධාන වෙළෙඳ පොළ වූ බටහිර යුරෝපයෙන් විය. පසුගිය අවුරුද්ද හා සැසඳීමේදී බටහිර යුරෝපීය වෙළෙඳ පොළේ සාපේක්ෂ තත්ත්වය සියයට 2 කින් වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. 1979 මෙන්ම 1980 දීද මුළු පැමිණීම්වලින් සියයට 22 ක් වූයේ වැදගත්කම් අනුව දෙවන තැන ගත් ආසියානු වෙළෙඳ පොළෙනි. පසුගිය අවුරුද්ද හා සැසඳීමේදී සුළු අඩුවීමක් පෙන්නුම් කරමින් මුළු පැමිණීම් වලින් සියයට 5 ක් උතුරු ඇමෙරිකානු වෙළෙඳ පොළෙන් විය.

නවාතැන්, ආහාරපාන, ගමනා ගමන, නානාවිධ භාණ්ඩ මිළට ගැනීම සහ විනෝදත්මක කටයුතු සඳහා සංචාරකයින් වැය කරන මුදල් සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම්වලට ඇතුළත් වේ. 1980 සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයූ දළ ආදයම රුපියල් දශ ලක්ෂ 1,600 ක් ලෙස ඇස්තමේන්තු කෙරී ඇත. මෙය පසුගිය අවුරුද්දේ ඉපැයූ ආදයම සියයට 33 කින් ඉක්මවීමක් පෙන්නුම් කරයි. විශේෂ හැර ගැණුම් අයිතීන් සහ ඇමෙරිකානු ඩොලර්වලින් සඳහන් කරහොත්, දළ ඉපැයීම පිළිවෙලින් දශ ලක්ෂ 74·4 ක් හා දශ ලක්ෂ 97 කට සමාන වූ අතර එයින් පිළිවෙලින් සියයට 26 ක හා 27 ක වාර්ෂික වර්ධන වේගයන් දිස්විය.

## 1·26 සංඛ්‍යා සටහන

## 1979—1980 සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යාලේඛන

| ශීර්ෂය | 1979 | 1978 වඩා 1979 % වෙනස | 1980 | 1979 වඩා 1980 % වෙනස |
|---|---|---|---|---|
| 1· සංචාරක පැමිණීම් .. | 250,164 | 29·9 | 321,780 | 28·6 |
| 2· පැය 24 ට අඩු කලකට රට තුළ රැඳෙන විදේශික මගින් පැමිණීම් .. | 5,563 | 34·5 | 8,636 | 55·2 |
| 3· සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) .. | 2,777 | 34·7 | 3,529 | 27·0 |
| 4· සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ .. | 1,188·5 | 36·6 | 1,600·0(අ) | 34·6 |
| 4·2 වි ගැ හි ඒකක දශ ලක්ෂ .. | 59·0 | 44·4 | 74·4 | 26·0 |
| 4·3 එ ජ. ඩොලර් දශ ලක්ෂ .. | 76·3 | 36·7 | 97·0 | 27·1 |
| 5· පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5·1 විනෝදය .. | 227,218 | 27·8 | 292,062 | 28·5 |
| 5·2 ව්‍යාපාරික කටයුතු .. | 13,460 | 16·5 | 24,641 | 83·1 |
| 6· කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය .. | 163,206 | 27·3 | 215,650 | 32·1 |
| 6·2 ආසියාව .. | 56,187 | 56·1 | 72,022 | 28·2 |
| 6·3 උතුරු ඇමරිකාව .. | 13,941 | 12·2 | 15,408 | 10·5 |
| 7· මුළු සේවා නියුක්තිය .. | 43,409 | 19·9 | 53,018 | 22·1 |
| 7·1 සෘජු .. | 18,472 | 19·9 | 22,561 | 22·1 |
| 7·2 වක්‍ර .. | 24,937 | 19·9 | 30,457 | 22·1 |

මූලය: ලංකා සංචාරක මණ්ඩලය.

(අ) තාවකාලික.

සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු විදේශීය විනිමය ඉපැයීම්, රටේ මුළු විදේශ විනිමය ඉපැයීමේ වැදගත්කම් අනුව 1976 දී පැවති හයවන ස්ථානයේ සිට 1977 දී පස්වන ස්ථානය ලබාගත් අතර, 1978 හා 1979 වර්ෂවලදී ද එම ස්ථානයේ රැඳී සිටීමට සමත් විය. 1980 දී, පොල් නිෂ්පාදිත වල අපනයන ආදායම ඉක්මවා යාමෙන්, සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයූ විදේශ විනිමය ප්‍රමාණය, විනිමය ඉපැයීම් වැදගත්කම අතින් සිවුවන ස්ථානය ලබාගෙන ඇත. මෙම ව්‍යාපාරයෙන් ඉපැයෙන ආදායම් වර්ධනයේ වැදගත්කම ගෙවුම් තුලනය පිළිබඳ සංඛ්‍යා ලේඛන වලින් දිස් වේ. 1975 දී ගෙවුම් තුලන ප්‍රකාශනයේ සේවා ඉපැයීම් වලින් සියයට 22 ක් සංචාරක ව්‍යාපාරයෙන් ලැබුන අතර, 1979 දී මෙම කොටස සියයට 35 දක්වා වැඩිවී ඇත. 1980 දී මුළු සේවා ඉපැයීම් වලින් සියයට 35 ක් ලැබුණේ සංචාරක ව්‍යාපාරයෙන් බව පෙනී යයි.

ශ්‍රම සූක්ෂම ව්‍යාපාරයක් වශයෙන් සංචාරක ව්‍යාපාරය, සෘජු ලෙස සංචාරක අංශයේත්, වක්‍ර ලෙස වෙනත් අදාල අංශ හා අනුබද්ධිත අංශවලත් සේවා නියුක්තිය ඇති කරයි. මේ අනුව, සංචාරක ව්‍යාපාරය රජයේ රැකියා සැපයීමේ ප්‍රයත්නයට හිතකරව ක්‍රියා කර ඇත. සංචාරක අංශයෙන් සැපයූ සෘජු රැකියා ප්‍රමාණය 1979 පැවති 18,472 සිට 1980 දී 22,561 දක්වා වැඩි විය; 1980 දී වක්‍ර ලෙස සපයන ලද රැකියා ප්‍රමාණය 30,457 ක් විය. 1979 සැපයූ රැකියා ප්‍රමාණය හා සසඳන කල 1980 දී වක්‍ර හා සෘජු රැකියා ප්‍රමාණය සියයට 22 බැගින් වැඩිවී ඇත. 1980 දී සංචාරක ව්‍යාපාරය තුලින් සැපයුනු මුළු රැකියා ප්‍රමාණය 53,018 ක් වූ අතර, මෙයින් මෙරටට පැමිණි සෑම සංචාරකයින් 6·1 කෙනෙකු එක් රැකියාවක් බැගින් ඇති කිරීමට ඉවහල් වූ බව පෙනී යයි.

සංචාරක ව්‍යාපාරය, රජයෙන් ඉතා නොමසුරු ලෙස දුන් බදු සහන ලබා ගත් අංශයකි. 1980 වර්ෂය දක්වා මෙම අංශයේ වූ මුළු ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 888 ක් විය. ඉන් සියයට 77 ක් දේශීය ආයෝජන කොටස වූ අතර ඉතිරි සියයට 23 විදේශීය කොටස විය.

## ගෙවුම් තුලනය

ආනයනයන්ගේ අසීමිත වර්ධනය, වෙළෙඳ අනුපාතය තවදුරටත් පිරිහීම, ජංගම ගිණුමේ සහ වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය තියුණු ලෙස පුළුල් වීම, විදේශ වත්කම් සැළකිය යුතු ලෙස පහත වැටීම සහ ප්‍රධාන විදේශ මුදල්වලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ අගය පිරිහීම යන කරුණු 1980 වසරේ ගෙවුම් තුලන වර්ධනයන්හි ප්‍රධාන ලක්‍ෂණ විය.

වසර කිහිපයක් මුළුල්ලේ ඉතා අයහපත් හැසිරීමක් පෙන්නුම් කළ ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය 1977 දී යහපත් අතට හැරෙමින් එහි වෙළෙඳ භාණ්ඩ සහ ජංගම ගිණුමෙහි තරමක එහෙත් සතුටුදායක අතිරික්තයන් වාර්තා විය එතැන් සිට වෙළෙඳ භාණ්ඩ ගිණුමේ සහ ජංගම ගිණුමේ හිඟයන් නොකඩවාම වැඩිවෙමින් ගෙවුම් තුලනය නැවත වරක් අයහපත් අතට හැරුණි. 1980 දී වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය වූ රුපියල් දශ ලක්‍ෂ 16,140 (විගැහි දශ ලක්ෂ 750), මෙතෙක් වාර්තා වී ඇති ඉහළම හිඟය වන අතර එය මීට ඉහත වසරේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 7,288 ක හිඟයට වඩා සැළකියයුතු පිරිහීමක් පෙන්නුම් කරයි. සේවා සහ සංක්‍රාම ගිණුම්වල, පසුගිය වසරට වඩා විශාල අතිරික්තයක් පෙන්නුම් කළද, පුළුල් වූ වෙළෙඳ භාණ්ඩ ගිණුම් හිඟය, මීට සමාන හිඟයක් පෙන්නුම් කළ ජංගම ගිණුම තුළින් පිළිබිඹු විය.

1980 දී ජංගම ගිණුමේ හිඟය වූ රුපියල් දශ ලක්ෂ 10,739 (විගැහි දශ ලක්ෂ 499) මෙතෙක් වාර්තා වූ ඉහළම හිඟය වූ අතර එය 1979 වර්ෂයේ ජංගම ගිණුම් හිඟය වූ රුපියල් දශ ලක්ෂ 3,556 (විගැහි දශ ලක්ෂ 177) සමග සැසඳේ. 1980 දී මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 7,446 (විගැහි දශ ලක්ෂ 346), මෙතෙක් එක් වසරක් තුළ ලැබුණු විශාලතම ප්‍රමාණය වුවද, ජංගම ගිණුමේ හිඟය පියවීමට මෙය ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, වසර අවසන් වන විට සමස්ත ශේෂය රුපියල් දශ ලක්ෂ 2,967 (විගැහි දශ ලක්ෂ 166) ක හිඟයක් පෙන්නුම් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංචිත පහත වැටෙන්නට විය. සමස්තයක් ලෙස ගත් කළ දළ විදේශ සංචිත රුපියල් දශ ලක්ෂ 2,886 (විගැහි දශ ලක්ෂ 179) කින් සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත රුපියල් දශ ලක්ෂ 2,967 (විගැහි දශ ලක්ෂ 166) කින් අඩු විය. පිරිහෙමින් පැවති ගෙවුම් තුලන තත්ත්වය තවදුරටත් කැපී පෙන්වමින් විශේෂයෙන් වර්ෂයේ දෙවැනි භාගය තුළදී ශ්‍රී ලංකාවේ රුපියල් විනිමය අනුපාතිකය විදේශීය ප්‍රධාන ව්‍යවහාර මුදල් සමග සැළකිය යුතු මට්ටමකින් පහත වැටුණි.

සංවර්ධන වැඩ පිළිවෙලක් සඳහා යොමු වී ඇති රටක ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟයක් ඇති වීම අසාමාන්‍ය දෙයක් නොවේ. ඇත්ත වශයෙන්ම, ආර්ථිකයක් තුළට විදේශ සම්පත් ඇදගනු ලබන්නේ මෙවැනි හිඟයන් තුළිනි. මෙම අර්ථයෙන් බලන කල, 1978 සහ 1979 වසරවල වාර්තා වූ හිඟයන් අයහපත් තත්වයක් ලෙස සැළකිය නොහැකිය. ඇත්ත වශයෙන්ම, මෙම වසරවලදී විශාල විදේශ සම්පත් ප්‍රමාණයක් රැස් කර ගැනීමට රටට හැකි වූ අතර එමගින් ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමටත්, ශේෂය විදේශ වත්කම් තර කිරීමටත් දායක විය. අනෙක් අතට, 1980 ගෙවුම් තුලන වර්ධනයේ ලක්ෂණය වූයේ, විදේශීය මාර්ගවලින් රැස් කර ගන්නා ලද සම්පත් ප්‍රමාණය ජංගම ගිණුමේ කොටසක් පමණක් පියවීමට ප්‍රමාණවත් වීම නිසා, ශේෂය පියවීම සඳහා මෙතෙක් රැස් කරගෙන තිබූ විදේශ සම්පත් විශාල ප්‍රමාණයක් යොදා ගැනීමට සිදුවීමෙන් රටේ විදේශ විනිමය දුර්වල තත්ත්වයකට පත් වීමය.

1979 වසරට වඩා සියයට 12 ක් තරම් වූ තරමක වැඩිවීමක් පිළිබිඹු කරමින් 1980 දී මුළු අපනයන ආදායම රුපියල් දශ ලක්ෂ 17,711 (විගැහි දශ ලක්ෂ 823) ක් විය. 1980 දී අපනයන ඉපැයීම්වල මෙම වර්ධනය, වැඩි වූ මිලයන්හි ප්‍රතිඵලය විය. ඇත්ත වශයෙන්ම, ඉකුත් වසර සමග සසඳන කල අපනයන ප්‍රමාණ දර්ශකය නොවෙනස්ව පැවති අතර, අපනයන මිළ දර්ශකයේ සියයට 15 ක තරමක වැඩිවීමක් පෙන්නුම් කෙරිණ.